# බුද්ධ ප්‍රතිමා ඇසුරින් ගොඩනැගෙන දොළොස් දහස් රටේ බෞද්ධ ඉතිහාසය පිළිබඳ අධ්‍යනයක් (මොණරාගල දිස්ත්‍රික්කයේ බුද්ධ ප්‍රතිමා ඇසුරින්)

එච්. ඒ. ඩී. එන්. එච්. ආරච්චි
රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
dilaninuwanthika2014@gmail.com

ශ්‍රී ලංකාවේ බටහිර, නිරිත, දකුණු, නැගෙනහිර හා ගිණිකොන ප්‍රදේශයෙන් ආවරණය වන රෝහණ රාජ්‍යය ක්‍රි.ව.3 වන සියවස් තරම් ඓතහාසිකත්වයක් උසුලන පුරාතන බල ප්‍රදේශයකි. මෙහි පුරාවස්තු පිළිබඳව අධ්‍යයනය කිරීම පුරාවිද්‍යාඥයන්ට එම යටගියාවේ යථා තතු හදුනා ගැනීමට මහෝපකාරී වෙයි. විශේෂයෙන් පුරාවස්තු අතර දක්නට ලැබෙන සුවිශේෂී කලාවක් වූ බුද්ධ ප්‍රතිමා කලාව රෝහණය පුරා දක්නට ලැබේ. නූතනයේ ඌව පළාතට අයත් මොණරාගල දිස්ත්‍රික්කය පුරා එවැනි බුද්ධ ප්‍රතිමා විසිරී පවතී. අතීතයේ ඉහළ ඌව අටදහස් රට නමිනුත්, පහළ ඌව දොළොස්දහස් රට නමිනුත් ඓතිහාසික මූලාශ්‍රවල හඳුන්වන ලද ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කය වඩාත් ප්‍රකට වන්නේ බුද්ධ ප්‍රතිමාවලට වඩා බෝධිසත්ත්ව ප්‍රතිමා සඳහා ය. බෝධිසත්ත්ව ප්‍රතිමාවලට අමතර ව රෝහණයේ බුදු පිළිම කලාවක් පැවතියේ ද? එය බෝධිසත්ත්ව ප්‍රතිමාවලට වඩා පැරණි ද? රෝහණ රාජ්‍යයට වෛතුල්‍යවාදය ව්‍යාප්ත වූ පසු එහි ඉදිවූයේ බෝධිසත්ත්ව ප්‍රතිමා පමණක් ද? ආදිය පිළිබඳව තොරතුරු හදුනාගැනීම වැදගත් වේ. එබැවින් රෝහණයේ තිබූ ප්‍රත්‍යන්ත ප්‍රදේශයක් වූ මොණරාගල ප්‍රදේශයේ පැවති පැරණි බෞද්ධාගමික ප්‍රබෝධය හදුනාගැනීම සඳහා බුද්ධ ප්‍රතිමා පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ. මොණරාගල දිස්ත්‍රික්කයේ බුද්ධ ප්‍රතිමා ව්‍යාප්ත ව ඇති ප්‍රදේශ හඳුනාගැනීම, එම බුද්ධ ප්‍රතිමා අයත් කාල වකවානු හා බුද්ධ ප්‍රතිමා ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳව මෙන්ම එම බුද්ධ ප්‍රතිමා ඉදිකිරීම පිණිස සමාජ පසුබිම සංවිධානය වූ අන්දම ආදී කරුණු අධ්‍යයනය තුළින් රෝහණයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු රාශියක් ඒකරාශි කරගත හැකි වීම මෙම පර්යේෂණයේ මූලික ප්‍රතිඵලයයි. එයට බුද්ධ ප්‍රතිමා මූලාශ්‍රයක් සේ යොදා ගැනීම මෙම පර්යේෂණයෙහි සුවිශේෂත්වය වේ. මූලාශ්‍රය පරිශීලනය මෙහි දී මූලික වන අතර ප්‍රාථමික දත්ත ඒකරාශි කිරීම, එසේම පුස්තකාලවල මෙතෙක් ඇති ග්‍රන්ථ, සඟරා, සංඛ්‍යා ලේඛන වාර්තා ආදිය මෙන්ම මොණරාගල ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශ ඇසුරින් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරමින් කරුණු රැස්කිරීම හා ඒවා පිළිවෙලකට සකසමින් නිගමනය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙමි.

**ප්‍රමුඛ පද:** රෝහණ දේශය; බුද්ධ ප්‍රතිමා; මොණරාගල ; බෝධිසත්ව ප්‍රතිමා; විහාර